# ඉත්තෑ බබයි චූටි බබයි



කතාව සහ චිත්‍ර : ජේ.ඒ. ශෙනුලි නිම්තකී ජයවර්ධන

# ඉත්තෑ බබයි

# චූටි බබයි

## කතාව සහ චිත්‍ර

## ජේ.ඒ. ශෙනුලි නිම්තකී ජයවර්ධන

**මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර.**
**3 ශ්‍රේණිය**
**2025.02.08**

කතෘගේ වෙනත් කෘති

- මුතු කුමාරි

ISBN 978-624-208-535-7

## පිදුම

**ආදරණීය වත්සලා අමරසේන පන්තිභාර ගුරුතුමිය වෙත පුදමි.**

# පෙරවදන

සාහිත්‍යය දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි. ලක් ඉතිහාසයේ කොටවේ, දඹදෙණි යුග කැපී පෙනෙන්නේ ද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝධවත් කාල පරිච්ඡෙද නිසාය. එසේ නම් මහාමයා ඉතිහාසයේ ද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි. දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි. පාසළ තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩ නගා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්තකර මෙවර ගෝලිය ශිෂ්‍ය ප්‍රජාව ම ඊට සම්බන්ධ කරගැනීමට අප ගත්කතුවරියන් සමත්වීම සුවිශේෂ සිදු වීමකි.

ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාවම ආදි කතෘ කරඳන අත්ථදස්සි මාහිමිපාණන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද ග්‍රන්ට කරණයට යොමු කරන "හෙරණගත්කරණී " ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය.

මෙම ශාස්ත්‍රිය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇති කරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක් ද වෙයි. ජීවිතයේ මුල් අවධියේම තම සහජ කුසලතාව හඳුනාගනිමින් ලේඛන කරණයට යොමුවීමේ ප්‍රතිඵලයක් ලෙස එළිදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සඳහා අත්වැලක් වනු නො අනුමානය.

විදුහල්පතිනිය.
ශශිකලා සේනාධිර.
මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර

එදා ලස්සන දවසක්. නිවාඩු කාලේ නිසා චුටි බබාට නිවාඩු. එදා චුටි බබාගේ අම්මාටයි තාත්තාටයි නිවාඩු දවසක්. ඒක නිසා ම බබාගේ අම්මයි තාත්තයි උදෙන් ම නැගිටලා මිදුල අතුගානවා, මල් පෝච්චි හදනවා, ගස් වලට වතුර දමනවා.



චුටි බබාත් උදෙන් ම නිදිමතේ නැගිටලා මිදුල පැත්තට ගියා. චූටි බබාටත් මල් වලට වතුර දමන්න හිතුණා. බබා මල් පෝච්චි ටික ළඟින් යනකොට මෙන්න, ගලකට කළු පාටයි සුදු පාටයි කටු ඇවිල්ලා. බබා හොඳටම බයවුණා.



බබා කෑ ගහගෙන අම්මා ඉන්න පැත්තට දුවන්න හැදුවා. බබා කෑ ගැහුව සද්දෙට ගල පෙරලෙන්න පටන් ගත්තා. එතකොට ම අම්මයි තාත්තයි දුවගෙන එතනට ආවා.

“අනේ... මෙන්න බලන්නකෝ පුංචි ඉත්තෑ බබෙක් ගෙදර යන්න පාර හොයාගන්න බැරිවෙලා” තාත්තා කීවා. ඉත්තෑ බබා මේ කට්ටියව දැකලා දුවලා දුවලා ගිහින් ගබඩා කාමරේ මුල්ලක හැංගුණා.




බයවෙලා හිටිය ඉත්තෑ බබා දැකලා චුටි බබාට දුක හිතුණා. හොද වෙලාවට අපි මෙයාව දැක්කේ, නැත්නම් මෙයාව බල්ලෝ කයි. එහෙම කියන ගමන් තාත්තා කාමරේ දොරට දැලක් හරස් කළා බල්ලන්ට රිංගන්න බැරිවෙන්න.



එතකොටම චුටි බබාට ආස හිතුණා ඉත්තෑ බබාව ගෙදර තියාගන්න. බබා තාත්තාගෙන් මෙහෙම ප්‍රශ්නයක් ඇහුවා. “ තාත්තේ අපිට බැරි ද මෙයාව ගෙදර තියාගන්න.” “අනේ...එච්චරයි අඩු” අම්මා කීවා. තාත්තා මොකුත් කියන්නේ නැතිව හිටියේ චුටි බබාට දුක හිතෙයි කියලා.



චුටි බබා ටික වෙලාවක් සෙල්ලම් කර කර ඉඳලා එයාගේ කාමරයට ගියා. චුටි බබා කාමරයට ගියාට පස්සේ අම්මයි තාත්තයි ඉත්තෑ බබා ගෙදර යවන්න ඕනෑ කියල බබාට තේරුම් කරලා දෙන්න පොඩි උපායක් කල්පනා කළා.




චූටි බබා කාමරේ ඉදන් එළියට එද්දී බබාගේ අම්මයි තාත්තයි හිටියේ නෑ. බබා බයවෙලා හැමතැනම හෙව්වා. චූටි බබා අඬන්න යනකොටම අම්මයි තාත්තයි හැංගිලා හිටිය තැනින් එළියට ආවා.



“අන්න එහෙම තමයි ඉත්තෑ බබාටත් දුක හිතෙන්නේ”. එහෙම කිවේ තාත්තා. දැන් ඔයා ඉත්තෑ බබාව නිදහස් කරනවා නේද?” අම්මා ඇහුවා.  ඊ වුන ගමන් අම්මයි තාත්තයි එක්ක චුටි බබා ගිහිල්ලා දැල අයින් කරලා දැම්මා.



චුටි බබා රෑ නින්දට ගියෙත් ඉත්තෑ බබා ගැන හිත හිතා. ඊළඟ දවසේ උදෙන්ම නැගිට්ට බබා දුවගෙන දුවගෙන ගබඩා කාමරේ පැත්තට ගියා ඉත්තෑ බබා ගියාද කියලා බලන්න. ඉත්තෑ බබා ගිහිල්ලා.



බබාට තෑග්ගක් විදිහට ඉත්තෑ බබා ළඟ තිබුණ දිග ලස්සන කූරක් තියලා ගිහින් තිබුණා. චූටි බබාට හරි සතුටුයි. මොකද ඉත්තෑ බබාටත් එයාගේ අම්මයි තාත්තයි ළඟට යන්න හම්බ වුනානේ.



# පසුවදන



රටේ අනාගත සංවර්ධනයට ඉවහල්වන සාහිත්‍යය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මණ කරණය විභවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවත් ඔප්නැංවීමට සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩ නැගීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටන් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමු කරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වන විට ලේඛක අංකුර හැට දහසකට වැඩි ප්‍රමාණයක් දේශීය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි. එම බීජ දළුලා වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමයි. පාසලක් මුල්වීමෙන් අධ්‍යාපනයේ ඵලදායිතාව වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල් කලාප, පළාත්, ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ එකම ව්‍යාපෘතිය මෙයයි.

මෙවර ඒ සඳහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂුන් වහන්සේලා ද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි. මෙහිදි මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය, දියණියන්, ගුරුභවතුන්, දෙමාපියන් සහ ආදි ශිෂ්‍යාවන් දැක්වූ කැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමිවිය යුතුය.

මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලමයි. පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබාදිය නොහැකිය. මානව දැනුම ගබඩා කර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක්වීමත් සමඟ දරුවන් එයින් දුරස්වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරි මෙන්ම සමාජය තුළ විවිධ ගැටළු ප්‍රශ්න නිර්මාණය වීමට හේතු වී ඇති බව පර්යේෂණාත්මක ව සනාථ වෙයි. මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන් වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනා කර ඩිජිටල් තාක්ෂණය යුගයේ ස්මාර්ට් බාල පරම්පරාව නූතන තාක්ෂණය සමග ගළපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමග එක්ව විද්‍යුත් කෘති රචනා කරයි. තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙනයාමට මහාමායා බාලිකාවියන් ඩිජිටල් වේදිකාවක් ගොඩනගා දී තිබේ. තම නිසඟ, සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසි පුංචි ගත්කතුවර ඔබගේ ලේඛන දිවියට මගේ සුභාෂිංසන.

ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධීකාරක, සෙනවිරත්න මහලේකම්